# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,567 — 1965 නොවැම්බර් 24 වැනි බදාදා — 1965.11.24**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

**(වෙන වෙනම නොතු කර ගත හැකි පරිදි තැබෙ කොටසකටම අයත් එක් එක් කාණ්ඩයට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)**

## ආණ්ඩුවේ නිවේදන

අ.ආ.කා. අංක ඔ. 363/52

ඩෙන්මාර්කය වෙනුවෙන සුවිශේෂ හා පූර්ණ බලැති තානාපති වශයෙන් ලංකාවේ පෙනී සිටීමට පත්කරනු ලැබූ අයිවින් බාටල්ස් උතුමාණන් වහන්සේගේ අක්ත පත්‍රය, මහා රාජිනීන් වහන්සේ වෙනුවෙන්, අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ භාර ගත්හ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,

නි. විජේවර්ධන,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1965 නොවැම්බර් 23 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11–1160

---

## මිල පාලන දැන්වීම

ඩී. 403 වැනි අංකය දරණ ආහාර මිල නියෝගය

අතිරේක ආහාර ද්‍රව්‍ය

### මිල පාලන පනත

#### නියෝගය

මිල පාලක (ආහාර) තැන්පත් පින්නදුවගේ ආතර් සිල්වා වන මම (173 වන අධිකාරය වන), මිල පාලන පනතේ 4 වෙනි වගන්තියෙන් මිල පාලක (ආහාර) වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1965 නොවැම්බර් 17 වෙනි දින අංක 14,559 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1965 නොවැම්බර් 16 වෙනි දින අංක ඩී. 402 දරණ ආහාර මිල නියෝගය මේ දැන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) තවද, මීට යාකර ඇති උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් එක් එක් ද්‍රව්‍යය මෙරටට ගෙන්වන්නකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, තොග වෙළෙන්දෙකු විසින් තොග වශයෙන් විකිණීමේ දී දළබර හොණ්ඩරයක් ද, සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභෝගිකයෙකුට සිල්ලර වශයෙන් විකිණීමේදී ශුද්ධ බර රාත්තලක්ද, කොළඹ නගරයේ නාගරික සීමාවන් ඇතුලත විකිණිය හැකි වැඩිම මිල මේ දැන් පටන් මේ උපලේඛනයේ 2 වෙනි, 3 වෙනි හා 4 වෙනි තීරවල අනුපිළිවෙලින් සඳහන් කර තිබෙන මිල ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද, මෙම නියෝගයේ කාර්ය සඳහා—

(අ) උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් ද්‍රව්‍යයක ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වරකට දළබර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණය බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් :

(ආ) උපලේඛනයේ සඳහන් යම් ද්‍රව්‍යයකින් පරිභෝගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළබර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශය කම, උපලේඛනයේ 1 වෙනි තීරයේ සඳහන් කිසිම ද්‍රව්‍යයක් වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිල ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම් ස්ථානයක හෝ යම් වාහනයක උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිය ස්වාමිත්වයේ හෝ පාලනය යටතේ හෝ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට එවැනි ද්‍රව්‍ය කිසි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා එම ද්‍රව්‍ය සඳහා මේ නියෝගයේ වැඩිම මිල උසින් අඟලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිල පුවරුවක පටහන් කොට එම භාජනයට සම්බන්ධ කොට, එකී ද්‍රව්‍යය හා නියමිත වැඩිම මිල ඕනෑම ගණුදෙනුකාරයෙකුට පැහැදිලිව පෙනෙනසේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(6) එසේම මෙම නියෝගයේ කාර්‍ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සළකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සමමිත රාත්තලේ බර බවද නියම කරමි.

(7) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම, උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් තොග වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු හා උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තෙකු විසින්ම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්කර, එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) එම ද්‍රව්‍යයෙන් විකුණූ ප්‍රමාණය (බර අනුවයි) ;

(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල ;

(ඈ) වෙළෙඳාමේ ස්වභාවය එනම්, වෙළෙඳාම තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද, යනවග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(8) උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් යම් ද්‍රව්‍යයක් විකුණන විට ඒ විකුණනු ලබන ද්‍රව්‍ය යම්කිසි දෙයක ඔතනු ලැබෙ නම්, එහි මිළත්, උපලේඛනයේ 2 වෙනි 3 වෙනි හා 4 වෙනි තීරවල සඳහන් වැඩිම මිළ ගණන් වලට ඇතුළත් වන බවද නියම කරමි.

1965 නොවැම්බර් 23 වෙනි දින පස්වරු 3ට කොළඹ දී අත්සන් කරණ ලදී.

පී. ඒ. සිල්වා,
මිල පාලක (ආහාර).

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | 4 වැනි තීරය |
|---|---|---|---|
| වර්ගය | මෙරටට ගෙන්වන්නකු විසින් දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණියහැකි වාඩිම මිළ රු. ශ. | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ රු. ශ. |
| ඇනූ (රතුළූනු සහ වික්බෙලාපුර් හැර වෙනත් සියලූම) | 27 0 | 28 0 | 0 30 |
| කොත්තමල්ලි | 47 0 | 48 50 | 0 52 |
| පියළි නොකළ උළුඳු | 44 0 | 45 25 | 0 46 |
| මුංඇට | 39 50 | 40 75 | 0 41 |
| තෝර පරිප්පු | 47 75 | 49 0 | 0 50 |
| කඩල පරිප්පු | 46 25 | 47 50 | 0 48 |
| සියඹලා | 42 0 | 44 0 | 0 50 |
| අර්තාපල් | 24 0 | 25 0 | 0 27 |
| රතුළූනු | — | 24 0 | 0 28 |

සැලකිය යුතුයි.—(1) මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණිය යුතු නියමිත මිළ නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන් ය. එම මිළ ගණන්වලට ඉහළින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නොහැකිය.

(2) මෙරටට ගෙන්වන්නෙකු විසින් අය කරන මිළ හොණ්ඩර 10ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් විකුණන විට අය කරන මිළ විය යුතුය.

11-1235

---

අංක බිටී/2/65 දරණ ආහාර මිළ ආඥව පිරිසිදු කළ සුදුසීනි

## මිළ පාලන පනත

### නියෝගය

(173 වන අධිකාරය වන) මිළ පාලන පනතේ 3 (2) වන වගන්තිය සමඟ කියවිය යුතු 4 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මඩකලපු දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය (ආහාර) මිල පාලක තැන්පත් පීතාම්බරම් කාසිලිංගම් වන මම මේ නියෝගයෙන්,

(i) 1963 මාර්තු මස 8 වැනි දින අංක 13,556 දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ වූ 1963 මාර්තු 2 වැනි දින අංක බිටී/3/63 දරණ ආහාර මිළ නියෝගය වහා ම බලපැවැත්වෙන පරිදි අවලංගු කරමි.

(ii) මීට යා කර ඇති පළමුවන උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් සුදු සීනි දළබර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේදී එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩි ම මිළ ගණන් බව වහාම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(iii) මීට යා කොට ඇති දෙවැනි උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් මිළ ගණන් සිල්ලර වෙළෙන්දෙකු විසින් පාරිභොගිකයකුට සිල්ලර වශයෙන් විකිණීමේ දී ශුද්ධ බර රාත්තලක් එම උප ලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ ගණන් බව වහාම බලපැවැත්වෙන පරිදි මෙම නියෝගයෙන් නියම කරමි.

(iv) තවද මෙම නියෝගයේ කාර්‍ය සඳහා —

(අ) පිරිසිදු කළ සුදු සීනි ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම හෝ පිරිසිදු කළ සුදු සීනි වරකට දළ බර හොණ්ඩරයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බැගින් කොයි අන්දමට විකිණීම හෝ තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,

(ආ) පිරිසිදු කළ සුදු සීනි පරිභොගය පිණිස හෝ පාවිච්චිය පිණිස හෝ දළ බර හොණ්ඩරයකට අඩු ඕනෑම ප්‍රමාණයක් විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන. බවත්,

(ඇ) '' පිරිසිදු කළ සීනි '' කී විට සියළුම වර්ග වලට අයත් හකුරු අතහැර සලකනු ලබන බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(v) එසේම මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පිරිසිදු කළ සුදු සීනි වෙන වර්ගයක් සමඟ හෝ බාල වර්ගයක සීනි මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවකු විසින් නො විකිණිය යුතු බව නියම කරමි.

(vi) තවද, මෙම නියෝගයෙන් වැඩිම මිළ ගණන් නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම යම ස්ථානයක හෝ යම වාහනයක පිරිසිදු කළ සුදු සීනි සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබා ගෙන සිටිනා සෑම වෙළෙන්දෙකුම පිරිසිදු කළ සුදු සීනි ප්‍රමාණයක් සුදුසු භාජනයක දමා පිරිසිදු කළ සුදු සීනි සඳහා මෙම නියෝගයෙන් වැඩිම මිළ අගලකට වඩා අඩු නොවූ ඉලක්කම් වලින් මිළ පුවරුවක සටහන් කොට එම භාජනය සම්බන්ධ කොට පිරිසිදු කළ සුදු සීනි හා නියමිත වැඩිම මිළ ඕනෑම ගනුදෙනුකාරයකුට පැහැදිලිව පෙනෙන සේ එකී ස්ථානයේ හෝ වාහනයේ තැබිය යුතු බව නියම කරමි.

(vii) එසේම මෙම නියෝගයේ කාර්‍යය සඳහා '' රාත්තල '' හෙවත් '' රා. '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්ඩුපොයි බර ක්‍රමය අනුව සමමිත රාත්තලේ බර බවද නියම කරමි.

(viii) තවද මෙම නියෝගයෙන් වැඩිම මිළ නියම කරනු ලැබූ සෑම ප්‍රදේශයකම පිරිසිදු කළ සුදු සීනි තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකුම හෝ පිරිසිද කළ සුදු සීනි සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකු විසින්ම මිළම ගන්නා ඉල්ලුව හොත් පහත සඳහන් විස්තර එනම් :—

(අ) විකුණූ දිනය ;

(ආ) පිරිසිදු කළ සුදු සීනි විකුණූ ප්‍රමාණය (බර අනුව) ;

(ඇ) පිරිසිදු කළ සුදුසීනි විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල;

(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම් වෙළඳාම තොග වශයෙන් ද සිල්ලර වශයෙන් ද යන වග ඇතුළත් කුවිතාන්සියක් මිළයට ගන්නාට දිය යුතු බවද නියම කරමි.

(ix) පිරිසිදු කළ සුදු සීනි විකුණන විට එය යම් කිසි දෙයක ඔතනු ලැබේ නම් නැතහොත් බහා ලනු ලැබේ නම් එහි මිළත් පිරිසිදු කළ සුදු සීනි විකිණිය හැකි වැඩිම මිළ ගණන්වලට ඇතුළත් විය යුතු බවද නියම කරමි.

1965 නොවැම්බර් මස 18 වන දින, පෙ.ව. 10.00 ට
මඩකලපු දිසාපති කාර්යාලයේදී අත්සන් කරන ලදී.

පීතාම්බරම් කාසිලිංගම්,
මඩකලපුව දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය
(ආහාර) මිළ පාලක.

## I වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>පිරිසිදු කළ සුදු සීනි දළ බර හොණ්ඩරයක් විකිණිය හැකි වැඩිම තොග වෙළඳ මිල<br>රු. ශ. |
|---|---|
| මන්මුන උතුර ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ඇතුළත—මඩකලපුව සහ මන්මුනේ බටහිර ... ... ... | 74 0 |
| එරාවූර්පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ඇතුළත ... ... | 73 92 |
| කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ඇතුළත ... ... | 73 81 |
| මන්මුන දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ඇතුළත | 74 16 |

## 2 වැනි උපලේඛනය

| 1 වැනි තීරය<br>ප්‍රදේශය | 2 වැනි තීරය<br>පිරිසිදු කළ සුදුසීනි ශුද්ධ බර රාත්තලක් විකිණිය හැකි වැඩිම මිළ<br>රු. ශ. |
|---|---|
| මන්මුනේ උතුර ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ... ... | 0 69 |
| මන්මුනේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ... ... | 0 69 |
| එරාවූර් පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ... ... | 0 69 |
| කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය— | |
| (අ) උතුරු කෝරළේ පත්තු ගම්කායාී සභා ප්‍රදේශය හා කල්ලච්චි සහ පෙරිල්ලාවලි ග්‍රාමසේවක කොට්ඨාශය හැර කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය ඇතුළත ... | 0 68½ |
| (ආ) කෝරළේපත්තු උතුරු ගම්කායාී සභා ප්‍රදේශය හා කල්ලිච්චි සහ පෙරිල්ලාවලි ග්‍රාමසේවක කොට්ඨාශය ඇතුළත ... | 0 69 |
| මන්මුනේ දකුණ සහ එරුවිල් පෝරතිව් පත්තු ප්‍රාදේශීය ආදයම් නිලධාරියාගේ කොට්ඨාශය | 0 69 |

සැලකිය යුතුයි.—මෙම මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීම සඳහා නියමිත මිළ ගණන් නොවේ. ඒවා මෙම ද්‍රව්‍ය විකිණිය හැකි වැඩිම මිළ ගණන්ය.

11–1131

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රපිතයි